# නර්තනයේ නව මාන සොයා




මුහුණට මුහුණ

ශ්‍රීනාත් මද්දුමගේ

මෙයට අවුරුදු තුනකට පමණ පෙර ලද ආරාධනාවක් අනුව මෙල්බර්න් ආට්සෙන්ටර් හිදී පවත්වන ලද ලෝක නර්තන සන්දර්ශනයක් නැරඹීමේ අවස්ථාව මට හිමි විය. අප ලංකාවේ සිටියදී විවිධ මාධ්‍යයන් හරහා දැක තිබූ සහ අප ආසා කළ ලෝකයේ විවිධ ජාතීන්ට අයත් වූ නර්තන දැක බලා ගන්නට මේ ප්‍රසංගයේ දී අපට හැකි විය. මේ විවිධ ශෛලීන්ගේ නර්තන අතරට අපේ නර්තනත් ඇතුළත් වූවා නම් කෙතරම් අගනේදැයි ඒ අවස්ථාවේදී මට සිතුණි. මා එසේ සිතමින් සිටියදීම මා විශ්මයට පත් කරමින් අපේ උඩරට නැටුමක් වේදිකාව මත දිගහැරුණි. අපේ උඩරට පහතරට බෙර වාදනයත් අපූරු රංගනයත් දෙස ප්‍රේක්ෂකයන් ගල් ගැසී බලා සිටිනු මම දුටුවෙමි. අපේ නර්තනය වේදිකාව මත ඉදිරිපත් කළ නැටුම් කණ්ඩායම සිය දෙවන අංගය හැටියට ශ්‍රී ලාංකික නර්තනය බටහිර නර්තනය හා මුසු කොට තැනූ අපූරු නව නිර්මාණයක් ඉදිරිපත් කළේ විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර ද සමගිනුයි.

මේ අපූරු නිර්මාණය ඉදිරිපත් කළේ රංගන හා උදුම්බරා නර්තන කණ්ඩායම බව මම දැන ගතිමි. ඔවුන්ගේ මේ සුවිශාල හපන්කම සන්නස පාඨකයන් හමුවේ දිග හරින්නට මම අවුරුදු ගණනාවක් බලා සිටියෙමි. දැන් මට ඒ අවස්ථාව උදා වී ඇත . ඒ ඔවුන්ගේ නවතම නර්තන ප්‍රසංගය වන ස්පිරිට් ඔෆ් රිදම්ස් ප්‍රසංගය නිමිති කර ගනිමිනි. මේ සම්බන්ධයෙන් ඔවුන් හා කතා බහක නියැලෙන්නට මට අවකාශ ලැබුණි.

**ශ්‍රීනාත්**
එදා මෙල්බර්න් ආට් සෙන්ටර්හිදී පැවැත්වුණ ප්‍රසංගයේදී ඔබ ඉදිරිපත් කළ නර්තන අංග ගැන මුලින්ම කතා කරමුද? කොහොමද ඔබට ඒ අවස්ථාව උදා වුණේ?

**උදුම්බරා**
2003 වසරේ සිට අපේ රංගායතනය අපි පවත්වාගෙන යනවා. මම මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ නර්තනය පිළිබඳ බාහිර කථිකාචාර්යවරියක හැටියට සේවය කරන නිසා බටහිර රංග ශිල්පීන් සමග මුසු වෙන්නත් මට ඉඩ ලැබෙනවා. මේ කාරණා දෙක නිසා මට පෙළඹීමක් ලැබුණා අපේ නර්තනයත් බටහිර නර්තනයත් එක්ක කර නව නිර්මාණයක් පර්යේෂණයක් හැටියට කරන්න. ඒ අනුව රංගනත් මමත් ඔබ සඳහන් කළ නර්තනය නිර්මාණය කළා. ඇත්තටම අපට හරිම සතුටුයි ඒ නිර්මාණය එදා පැමිණ සිටි බොහෝ අය අගය කිරීම ගැන.

එයින් ලද ධෛර්යය නිසා තමයි මේ පර්යේෂණය දිගටම කරගෙන යන්න අපට හිතුණෙ. අපේ මේ අලුත් ප්‍රසංගයත් ඒ උත්සාහයේම කොටසක්.

**ශ්‍රීනාත්**
මෙය ඔබගේ කීවෙනි ප්‍රසංගයද?

**රංගන**
අපි අවුරුද්දක් පාසා ප්‍රසංග කරන්නෙ නැහැ. මේ අපේ තුන් වන ප්‍රසංගය. මෙතනදි අපි බලන්නෙ අපේ පන්ති වලට එන දරුවන්ගෙ උපරිම දක්ෂතාව ප්‍රේක්ෂකයන්ට ඉදිරිපත් කිරීමටයි. මේ සැරේ අපේ ප්‍රසංගයේ තේමාව ස්පිරිට් ඔෆ් රිදම්ස් කියන එකයි. නර්තනය හරහා දරුවන්ගේ කාය ශක්තිය වර්ධනය කිරීම කියන කාරණය මෙතනදි අපි අවධාරණය කරනවා. සම්ප්‍රදායික අඩිතාල ඉගෙන ගත්ත අපේ දරුවන් ලෝකයේ නව නර්තන සම්ප්‍රදායක් වන සුම්බා නර්තනය දක්වා ගෙන යන්න අපි උත්සාහ කරනවා.

**ශ්‍රීනාත්**
අප දන්නා පරිදි මේ සුම්බා කියන නර්තනය 1990 දී පමණ ලතින් ඇමරිකානු නර්තන ශිල්පියකු වන ඇල්බර්ටෝ පෙරේස් ්කඉැරඑද ,ඊැඑද, ඡැරු'* ගේ නිර්මාණයක්.

**උදුම්බරා**
ඔව්. මේ සුම්බා නර්තන කලාවට හිප් හොප් සොකා සම්බා සල්සා මම්බෝ වැනි නර්තන විලාශයනුත් එක්වෙනවා. රංගන මේ නර්තන සම්ප්‍රදාය ඉතා ශාස්ත්‍රානුකූලව හදාරා ඒ දැනුම දැන් අපේ පන්ති හරහා අපේ ප්‍රජාවට බෙදා දෙනවා. අපි මුලින් සඳහන් කළ පරිදි කාය වර්ධනයත් මේ හරහා සිදුවෙනවා. මේ සම්ප්‍රදායන් අපේ සම්ප්‍රදායික නර්තනාංග හා එක්කර අපේ නවතම ප්‍රසංගය නිර්මාණය කර තිබෙනවා.

**ශ්‍රීනාත්**
අපේ සම්ප්‍රදායික නර්තනාංග වලින් මේ ප්‍රසංගයට ඇතුලත් වන අංග මොනවාද?

**රංගන**
තුරඟා වන්නම ඇතුලු වන්නම් රැසක් මේ ප්‍රසංගයේදී අපි ඉදිරිපත් කරනවා. මේ අතරින් මෙල්බර්න් හිදී ප්‍රථම වතාවට අපි ඊරඩි වන්නම ඉදිරිපත් කරනවා. මේ වන්න-මේ කියවෙන්නෙ සුර අසුර යුද්ධය පිළිබඳවයි. නිසි ලෙස විශ්ලේෂණය කර බැලුවාම අපට පේනවා මේ අපේ නර්තන තුළත් කාය වර්ධනය කියන එක සැඟවිලා තියෙන බව. මෙන්න මේ කාරණය ඉදිරියට ගන්න අපේ ප්‍රසංගයේදී අපි උත්සාහ ගන්නවා.

**ශ්‍රීනාත්**
එයට අමතරව..?

**උදුම්බරා**
මෙහිදී අපි ලෝකයේ විවිධ බෙර සමග අපේ බෙරත් මුහු කොට සන්ධවනියක් ඉදිරිපත් කරනවා. මෙයට ඉන්දියානු ලතින් ඇමරිකානු අප්‍රිකානු සහ ශ්‍රී ලංකාවේ බෙර වර්ග අතුලත් වෙනවා. මේක අපේ ප්‍රේක්ෂකයන්ට සුවිශේෂී අත්දැකීමක් වේවි.

**ශ්‍රීනාත්**
මේ ප්‍රසංගයට කොපමණ දෙනෙක් සහභාගිවෙනව-ාද?

**රංගන**
ප්‍රසංගයට නර්තන ශිල්පීන් ශිල්පිණියන් 100 කට වැඩි ප්‍රමාණයක් සහභාගිවෙනවා. අවුරුදු 4 සිට වැඩිහිටියන් දක්වා ශිල්පීන් මෙයට එක්වෙනවා. ප්‍රසංගය හරියටම සවස 5.30 ට ආරම්භ කරනවා. ඒ නිසා අපි ඉල්ලා සිටින්න කැමතියි සවස 5.30 ට පෙර ශාලාවට පැමිණ සිටින්න කියලා.

**ශ්‍රීනාත්**
මෙයට ඔබට සහය වන අය ගැන සිහිපත් කළොත්?

**උදුම්බරා**
මේ ප්‍රසංගය සාර්ථක කරගන්න අපට සහය වෙන දෙමාපියන් ගැන විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෙ. ඒ වගේම ආලෝකකරණයෙන් උදය බණ්ඩාර හා ජගත් කොතලාවලත් අපට සහය වෙනවා.

වෘත්තියෙන් බැංකු කළමණාකාරවරයකු වන රංගන විද්‍යාවේදී උපාධිධරයෙකි. ඔවුන් ඔස්ට්‍රේලියාවට සංක්‍රමණය වන්නේ උදුම්බරා කොළඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්ය වරියයක ලෙසත් රංගන නීතිඥවරයකු ලෙසත් ශ්‍රී ලංකාවේ සේවය කරමින් සිටියදී ය. ඒ වැඩි දුර අධ්‍යාපනය ලබා ගැනීම සඳහා ය. ප්‍රවීණ නාට්‍යවේදී එස් කරුණාරත්න ශූරීන්ගේ දියණිය උදුම්බරාත් ඩී එස් සේනානායක විද්‍යාලයේ නර්තන ආචාරිණී නන්දා රත්නතුංග ශිල්පිණියගේ පුත් රංගනත් අපේ සම්ප්‍රදායික නර්තනය විශ්ව නර්තන සම්ප්‍රදායන් හා බද්ධ කරන්නට දරන මේ උත්සාහය අගය කළ යුතු ය. ඔවුන්ගේ ගමනට අපේ ආශිර්වාදය හිමිවෙයි.

මාර්තු 4 වන දින සවස 5.30ට බීසන් සෙන්ටර් රඟහලේ දී පැවැත්වෙන ස්පිරිට් ඔෆ් රිදම්ස් ප්‍රසංගය පිළිබඳ වැඩිදුර විස්තර 9561 7137 හා 0417 149136 දුරකතන අංක වලට ඇමතීමෙන් ලබා ගත හැකි ය.

